ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනපති උපාධි වැඩසටහන

අවසාන පරීක්ෂණය - 2018/2019

**ESP2318/STP9618-** අධ්‍යාපන කළමනාකරණය

කාලය - පැය තුන (03) යි.

---

දිනය : 2019.03.24 වේලාව : පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

ඕනෑම ප්‍රශ්න තුනකට (03) පිළිතුරු සපයන්න.

01. i. කළමනාකරණය යන්න නිර්වචනය කරන්න. (ලකුණු 08)

ii. ඕනෑම ආයතනයක කළමනාකරුවකු විසින් ඉටුකළ යුතු විවිධ භූමිකා මොනවා ද? (ලකුණු 12)

iii. වර්තමානයේ කළමනාකරුවන් මුහුණ දෙන ප්‍රධාන අභියෝග සාකච්ඡා කරන්න. (ලකුණු 13)

02. i. මූලික කළමනාකරණ ක්‍රියාකාරකම් හතර (04) ඕනෑම අධ්‍යාපන ආයතනයක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

ii. කළමනාකරණයේදී විද්‍යාත්මක ප්‍රවේශය හා චර්යාත්මක පිවිසුම යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 12)

iii. ඔබගේ ආයතනයේ වර්තමාන පරිසරයට අදාලව වඩාත් සුදුසු වන්නේ විද්‍යාත්මක ප්‍රවේශය ද නැතහොත් චර්යාත්මක පිවිසුමදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 13)

03. i. වෙනස්වීම් කළමනාකරණය යනු කුමක් ද? (ලකුණු 08)

ii. 'ඕනෑම ආයතනයක ඇතැම් සේවකයන් වෙනස්වීම පිළිගැනීමට පසුබට වේ.' පැහැදිලි කරන්න. (ලකුණු 12)

iii. ඔබේ ආයතනයේ ඵලදායී අයුරින් වෙනස්වීම් ක්‍රියාත්මක වන්නේ කෙසේද? ඔබ විසින් උගත් වෙනස්වීම් ආකෘතියක් ඇසුරෙන් පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 13)

04. i. 'නායකත්වය' යන පදය නිර්වචනය කරන්න. (ලකුණු 08)

ii. 'සියළුම නායකයන් කළමනාකරුවන් නොවන අතර සියළුම කළමනාකරුවන් නායකයන් ද නොවේ.' ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 12)

Iii ඔබගේ ආයතනයේ ඵලදායීතාව හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා කුමන නායකත්ව ශෛලයක් ඔබ නිර්දේශ කරන්නේ දැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 13)

05. i. සන්නිවේදනය යනු කුමක් ද? (ලකුණු 08)

ii. ඕනෑම ආයතනයක භාවිතා කළ හැකි සන්නිවේදන ක්‍රියාවලියක් පැහැදිලි කරන්න. (ලකුණු 12)

iii. 'බොහෝ ආයතනයන්හි සන්නිවේදනය ඉහළ සිට පහළ ගමන් කරයි.' මෙම ප්‍රකාශය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 13)

06. i. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ දක්නට ලැබෙන අධ්‍යාපන ගැටළු පහක් **(05)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

ii. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය මුහුණ දෙන කළමනාකරණ, පරිසරාත්මක හා තාක්ෂණික ගැටලු /ප්‍රශ්න මොනවා ද? (ලකුණු 12)

iii. ඉහත ගැටලු විසඳීම සඳහා රජය ගෙන ඇති පියවරයන් විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 13)

හිමිකම් ඇවිරිණි.